# ආහාර බෙදා හැරීමේ ක්‍රියාවලිය

ආහාර යන පුළුල් ක්ෂේත්‍රය තුළ නිෂ්පාදනය, බෙදා හැරීම සහ පරිභෝජනය යනුවෙන් අවස්ථා කිහිපයක් ඇත. නමුත් වැඩි දෙනෙකුගේ අවධානය යොමුවී ඇත්තේ නිෂ්පාදනය සහ පරිභෝජනය යන අංශ දෙක කෙරෙහි පමණය. නමුත් ඒ අංශ දෙකටත් වඩා වැදගත් වන්නේ සැකසීම සහ බෙදා හැරීමයි. යම් භාණ්ඩයක් නිෂ්පාදනය කළ පසු අවශ්‍ය පුද්ගලයාට, අවශ්‍ය වෙලාවට, අවශ්‍ය ස්ථානයට අවශ්‍ය ආකාරයට ලබාදීම කරනුයේ සැකසීම හා බෙදා හැරීම තුළිනි. සැකසීම හා බෙදා හැරීම සරළව අලෙවිය යනුවෙන් ද හැඳින්විය හැකිය. අද බොහෝ දෙනා අලෙවිය, නිෂ්පාදනයෙන් වෙන්වූ ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරති. නමුත් එය සම්පූර්ණයෙන්ම වැරදිය. පොහොර, භාවිතය වැඩි වන විට නිෂ්පාදනය වැඩි වන්නා සේ අලෙවිය සාර්ථක නම් නිෂ්පාදනය වැඩිවේ. දැනට ශ්‍රී ලංකාවේ ආහාර බෙදා හැරීමේ ක්‍රියාකලාපය විග්‍රහකිරීම මෙම ලිපියේ පරමාර්ථය වේ.

ඕනෑම රටක ආහාර බෙදාහැරීමේ ක්‍රියාවලිය එරට අර්ථ ක්‍රමය සහ රාජ්‍ය ප්‍රතිපත්ති හා සෘජුව සම්බන්ධවේ. ඒ අනුව ආහාර බෙදා හැරීමේ ක්‍රියාවලිය අවස්ථා තුනක් යටතේ සාකච්ඡා කළ හැකිය.

1. පුද්ගලයා ප්‍රමුඛ කොටගත් බෙදාහැරීමේ ක්‍රියාවලිය
2. රාජ්‍ය අංශය ප්‍රමුඛ කොට බෙදාහැරීමේ ක්‍රියාවලිය
3. පෞද්ගලික අංශය ප්‍රමුඛ කොටගත් බෙදාහැරීමේ ක්‍රියාවලිය

## පුද්ගලයන් ප්‍රමුඛ කොටගත් බෙදාහැරීමේ ක්‍රියාවලිය

ආර්ථික වර්ධන ක්‍රියාවලියේ මුල් අවස්ථාවේ මෙම ක්‍රමය ප්‍රචලිතව පැවතුනි. ප්‍රාථමික ආර්ථික ක්‍රමයක මූලික තාක්ෂණය "ස්වයං පෝෂිත" භාවයයි. එනම් තමන්ට අවශ්‍ය දේවල් තමන්ම නිෂ්පාදනය කර ගැනීමයි. මේ නිසා ප්‍රාථමික ආර්ථික ක්‍රමයක බෙදාහැරීමේ ක්‍රියාවලියක් දක්නට නැත. ප්‍රාථමික ආර්ථික ක්‍රමය, වර්ධන අවස්ථාවට පත්වීමත් සමඟ බෙදාහැරීම ආරම්භ විය. තමන්ට අවශ්‍ය සියල්ල තමන්ම නිෂ්පාදනය කිරීමට වඩා තමන්ට හැකියාවක් ඇති ද්‍රව්‍ය නිෂ්පාදනය කර අනෙක් අය සමඟ හුවමාරු කිරීමත් සමඟ ස්වයං පෝෂිත ආර්ථික ක්‍රමය "හුවමාරු ආර්ථික" ක්‍රමයක් බවට පරිවර්තනය විය. උදාහරණයක් ලෙස වලන් නිෂ්පාදනය කිරීමට දක්ෂතාවක් ඇති වලන්කරු වලන් නිෂ්පාදනය කර දඩයම්කරු සමඟ "දඩමස්" හුවමාරු කිරීම දැක්විය හැක. මෙහිදී හුවමාරුව සිදුවන්නේ පුද්ගලයන් අතරය. උවමනාවක් ඇති දෙදෙනෙකු හමුවීම මේ සඳහා අවශ්‍ය වේ. භාණ්ඩයට භාණ්ඩයක් හුවමාරු වේ. භාණ්ඩ බෙදාහැරීම සෘජුවම පුද්ගලයන් අතර සිදුවන නිසා මෙම ක්‍රමය පුද්ගලයන් මුල්කර ගත් බෙදාහැරීමේ රටාව ලෙස සැලකේ. මෙම ක්‍රමයේ මුල් අවස්ථාවේදී වෙළඳපොළක් දක්නට නැත. නමුත් කල්යත්ම එකිනෙකා හමුවීම සඳහා තෝරාගත් දිනක තීරණය කරගත් වේලාවක පොදු ස්ථානයක් තෝරාගැනීම නිසා භාණ්ඩ හුවමාරුවට වෙළඳපොළ එකතු විය. නමුත් අතරමැදියන්ගෙන් තොරව භාණ්ඩ හුවමාරු කර ගැනීම විශේෂ ලක්ෂණයකි. හුවමාරුව පහසුකිරීම සඳහා කාලයත් සමඟ මුදල් භාවිතයද එකතු විය.

පුද්ගලයන් මුල්කරගත් බෙදාහැරීමේ රටාව නාගරීකරණයත් සමඟ ක්‍රියාත්මක කිරීම අපහසු විය. නිෂ්පාදන ප්‍රදේශවලට අමතරව පාරිභෝගික ප්‍රදේශ බිහිවන්නට විය. උඩරට එළවළු වර්ගවලින් 75% පමණ නිෂ්පාදනය කරනු ලබන්නේ නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක දෙක තුළිනි. නමුත් ඒවා වැඩිපුර පරිභෝජනය කරන්නේ ගාල්ල, මාතර, කොළඹ වැනි දිස්ත්‍රික්ක තුළයි. පුද්ගලයා මුල්කර ගත් බෙදාහැරීමේ රටාවක් තුළ නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා එකිනෙකාට හමුවිය හැකිසේ සමීපව ජීවත්විය යුතුය. උදාහරණයක් ලෙස එකම ගමක ජීවත්වීම දැක්විය හැකිය. නමුත් නිෂ්පාදකයන්, පාරිභෝගිකයන් එකිනෙකට දුරස්ථ වීමත් සමඟ මේ ක්‍රමයෙහි වැදගත්කම හීන විය. නමුත් මෙම ක්‍රමය "පොළ තුළ" සුළු වශයෙන් අදත් දක්නට ලැබේ.

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ**
**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී**
**එල්.පී. රූපසේන විසිනි**

## රාජ්‍ය අංශය ප්‍රමුඛකොට ගත් බෙදාහැරීමේ ක්‍රියාවලිය

සුභසාධක රාජ්‍ය සංකල්පය වර්ධනය වීමත් සමඟ රජය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුව සම්බන්ධවීම ආරම්භ විය. රටක ජනතාවට අවශ්‍ය ආහාර සාධාරණ මිලකට අඛණ්ඩව පහසුවෙන්

සැපයීම රජයේ වගකීම බව ශුභසාධක රාජ්‍ය සංකල්පයන් සමඟ වර්ධනය විය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය ආහාර බෙදාහැරීමට සෘජුවම සම්බන්ධවීම බ්‍රිතාන්‍ය පාලන කාලය දක්වාම දිවයයි. දෙවන ලෝක යුද්ධයත් සමඟ ඇතිවූ ආහාර හිඟයත් සමඟ යටත් විජිත ආණ්ඩුව සිය යටත් වැසියන්ට ආහාර සැපයීමට කෙලින්ම සම්බන්ධ විය. 1948 නිදහස ලබාගත් පසු වුවද රාජ්‍ය මැදිහත්වීම අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, 1970 - 1977 කාලයේ රාජ්‍ය මැදිහත්වීම උපරිම අන්දමින් ක්‍රියාත්මක විය.

ආහාර බෙදාහැරීමේ ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධවූ රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු සහ ආයතන ගණනාවක් විය.

1. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව:- ගම් මට්ටමින් පිහිටුවා ඇති සමූපකාර සමිති මගින් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ජනතාවට බෙදාහැරීම මූලික කාර්යය වේ. ඊට අමතරව වී වැනි ගොවි ද්‍රව්‍ය මිළදී ගැනීම ද කරනු ලැබේ.

2. ආහාර දෙපාර්තමේන්තුව :- අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය පිටරටින් ගෙන්වීමේ වගකීම පවරා තිබුණි. 1977 පසු විවෘත ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක වීම සමඟ නිදහස් ආනයන ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඒ අනුව අද ආහාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය වී ඇත්තේ ආහාර සැපයුම පිළිබඳව අධීක්ෂණය කිරීමයි.

3. අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව එළවළු මිළදී ගැනීම සහ අලෙවි කිරීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්ය භාරය විය. 1992 වර්ෂයේදී මෙම ආයතනය වසා දමන ලදී.

4. සමූපකාර තොග වෙළඳ සංස්ථාව(සතොස) අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම සහ ගොවි ද්‍රව්‍ය මිලදී ගැනීම සිදු කෙරේ.

5. වීඅලෙවි මණ්ඩලය - වී මිලදී ගැනීම, වී කෙටීම සහ සහල් බෙදාහැරීම ප්‍රධාන කාර්ය භාරය විය. අද එහි කටයුතු අක්‍රිය වී ඇත.

6. සමූපකාර අලෙවි මණ්ඩලය (මාක්ෆෙඩ්) - ගොවි ද්‍රව්‍ය මිළදී ගැනීම සහ අලෙවිකිරීම ප්‍රධාන කාර්ය භාරය වේ.

1977 විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දීමත් සමඟ ආහාර බෙදා හැරීමේ ක්‍රියාවලියට රාජ්‍ය අංශයේ දායකත්වය 5%ටත් වඩා අඩුය. විවෘත ආර්ථික ක්‍රමයත් සමඟ වර්ධනය වූ පෞද්ගලික අංශය සමඟ තරඟ කිරීමට නොහැකිවීම මෙම අර්බුදයට ප්‍රධාන හේතුවයි. 1977 තෙක් ක්‍රියාත්මක වූ සංවෘත ආර්ථික ක්‍රමය යටතේ රාජ්‍ය ආයතන බොහොමයකට ඒකාධිකාරී බලයක් ලැබී තිබුණි. ඒ තුළින් දූෂණය සහ අක්‍රමිකතා වර්ධනයවී අකාර්යක්ෂම පරිපාලන රටාවක් ගොඩනැගී තිබුණි. 1977 පසු විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දුන්නත් අද වනතෙක් රාජ්‍ය ආයතන ඊට සරිලන සේ ප්‍රතිව්‍යුහගත කිරීමක් කර නැත. විවෘත ආර්ථික ක්‍රමයට මුහුණ දිය හැකිවන පරිදි ස්වාධීනව කටයුතු කිරීමට හැකි පරිපාලන රටාවක් නිර්මාණය කළයුතුය. එමෙන්ම තමන්ගේ ආදායම මත යැපෙන තත්ත්වයක් ගොඩ නැගිය යුතුය.

## පෞද්ගලික අංශය ප්‍රමුඛකොට ගත් බෙදා හැරීමේ ක්‍රියාවලිය

1977 පසු විවෘත ආර්ථික ක්‍රමය යටතේ ආර්ථික තහංචි ඉවත් කර, ණය පහසුකම්, විනිමය පහසුකම් සහ බදු සහන ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස වඩ වඩා පෞද්ගලික අංශය ආහාර බෙදාහැරීමේ ක්‍රියාවලියට සම්බන්ධවීමක් දක්නට ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආහාර නිෂ්පාදන රටාවේ පැහැදිලි වෙනසක් මෑත කාලයේ සිදුවී ඇත. එනම් කොළඹ හා නුවර වැනි කොමිස් වෙළඳපොළවල් වටා කේන්ද්‍ර ගතවී තිබූ ආහාර බෙදාහැරීමේ රටාව නිෂ්පාදන හා පාරිභෝගික ප්‍රදේශ හා සෘජුව සම්බන්ධ වන විමධ්‍යගත හුවමාරු ක්‍රමයට ශීඝ්‍රයෙන් පරිවර්තනය වෙමින් පවතී.

කොමිස් වෙළඳාම යනු අලෙවිකරු විසින් නිෂ්පාදන අලෙවිකිරීම වෙනුවෙන් කොමිස් තබාගෙන, ප්‍රවාහන හා බැමේ වියදම් අඩුකර ඉතිරිය සැපයුම්කරුට යැවීමයි. එළවළු හා පළතුරු සඳහා 10%ක්ද, සහල් සහ අතිකුත් අතිරේක ආහාර ද්‍රව්‍ය සඳහා 3-5%ක්ද කොමිස් මුදල් වශයෙන් ලබාගනී. ශ්‍රී ලංකාවේ විශාලතම කොමිස් වෙළඳපොළවල් කොළඹ සහ මහනුවර පිහිටා ඇත. කොමිස් වෙළඳපළක විශේෂ ලක්ෂණය නම් සැපයුම්කරුවන් නිෂ්පාදන සමඟ පැමිණීම අවශ්‍යම නැත. ප්‍රවාහන නියෝජිතයන් මගින් නිෂ්පාදන කොමිස් වෙළඳපොළට එවා, මුදල්, ප්‍රවාහන නියෝජිතයන් මාර්ගයෙන් හෝ චෙක්පත් මගින් ලබාගත හැකියි. කොළඹ පිහිටි "මැනිං" එළවළු වෙළඳපොළට වැලිමඩ සහ බණ්ඩාරවෙල ගොවීන් එළවළු එවනු ලබන්නේ ප්‍රවාහන නියෝජිතයන් මගිනි. ගොවියෝ උදය වරුවේ එළවළු අස්වැන්න නෙළා සවස්

වරුවේ ගෝනිවල අසුරා ප්‍රවාහන නියෝජිතයන්ට බාරදීම සඳහා පාරට ගෙන එති. එළවළුවලට අමතරව කොමිස් වෙළෙන්දාට බාරදීමට ලියුමක්ද ගෙන එති. එම ලියුම් කවරය කොමිස් වෙළෙන්දා විසින් සපයන ලද්දකි. එම කවරයේ මතුපිට කොමිස් වෙළෙන්දාගේ නම සහ "කඩ බක්කියේ" අංකය මුද්‍රණය කර ඇත. එළවළු වර්ගවල බර ප්‍රමාණය සහ ප්‍රවාහන කුලී ලියුම් කවරය ඇතුළත සටහන් කර ඇත. ඊට අමතරව ගෝනියේ මතුපිට කඩ බක්කියේ නොම්මරය සහ කොමිස් වෙළෙන්දාගේ නමේ මුල් අකුරු (උදා:එස්.එම්.ඒ.) සටහන් කර ඇත. ගොවියා විසින් බාර දෙනු ලබන එළවළු තොග සහ ලියුම් කවරය කොමිස් වෙළෙන්දාට බාරදීමේ වගකීම ප්‍රවාහන නියෝජිතයන් සතුය. ඔවුන් එළවළු තොග ප්‍රමාණය කොමිස් වෙළඳපොළ දක්වා ප්‍රවාහනය කර "නාට්ටාමි" (බඩු බාන කම්කරුවන්) ලවා බක්කිවලට යවනු ලැබේ. එළවළු කොමිස් වෙළඳපොළට ලැබුණු පසු බක්කි දක්වා ප්‍රවාහනය කිරීම සඳහා සංවිධාන රටාවක් ඇත. ඒ ඒ ප්‍රදේශවල එළවළු බෑම සඳහා සංවිධාන වූ වෙනම නාට්ටාමිවරු ඇත. ඒ නාට්ටාමිවරුලවා එළවළු බෑම සංවිධානය කිරීම සඳහා වෙනම පුද්ගලයෙකු සිටී. ඔහු "ඕනර්" ලෙස හඳුන්වයි. ඔහුගේ කාර්යය වනුයේ ගොවීන් විසින් එවනු ලබන එළවළු අදාළ බක්කිවලට නාට්ටාමිවරුලවා බාරදීමත්, ලියුම්කවර බෙදා හැරීමත්, ලොරි කුලී, කඩබක්කිවලින් එකතු කර ලොරිවලට බාරදීමත්ය. මැනිං වෙළඳපොළ තුළ මෙසේ සංවිධානය වූ නාට්ටාමි කණ්ඩායම් 20ක් පමණ ඇත.

කොමිස් වෙළඳාම අතීතයේ ජනප්‍රිය වුවත් දැන් ක්‍රම ක්‍රමයෙන් එහි වැදගත්කම අඩුවෙමින් පවතී. ඊට බලපෑ ප්‍රධාන හේතු කීපයකි.

1. මිළ පිළිබඳ පවතින අස්ථිරතාව - සැපයුම්කරු සිය භාණ්ඩ අලෙවිකළ මිළ දැනගනු ලබන්නේ භාණ්ඩ අලෙවි කළ පසුය. එමෙන්ම කොමිස් වෙළෙන්දා සටහන් කරන මිළ පිළිගැනීමට සිදුවේ. මේ නිසා බොහෝ සැපයුම්කරුවන් වෙනත් විකල්ප අලෙවි මාර්ගවලට යොමු වී ඇත.
2. භාණ්ඩවල විශේෂයෙන් එළවළුවල තත්ත්වය බාලවීම නිසා ගැනුම්කරුවන්ගේ පැමිණීම අඩුවීම - කොමිස් වෙළඳාම තුළ කිසිවකු භාණ්ඩවල තත්ත්වය ගැන සැලකිලිමත් නොවේ. ප්‍රවාහනකරු පුළුවන් තරම් එළවළු ලොරිය තුළ පටවා ගනී. නාට්ටාමි කෑලි දෙකක් පමණ උර මත තබා ගනී. කොමිස් වෙළෙන්දාගේ කාර්යය වනුයේ පවතින මිළකට එළවළු අලෙවි කිරීමයි. එමෙන්ම එළවළු තොග වෙළඳපොළට පැමිණි පසු නැවතත් සිල්ලර වෙළඳුන් මිළදී ගෙන ප්‍රවාහනය කරන විට දින 2ක් පමණ කාලයක් ගතවේ. පැටවීමේ සහ බෑමේ වාර ගණනද වැඩිය. මේ නිසාද තත්ත්වය බාලවේ.
3. ප්‍රධාන නගරවල තිබෙන වාහන තදබදය නිසා වෙළඳුන් සහ ප්‍රවාහන නියෝජිතයන්, කොමිස් වෙළඳපොළවල් කරා පැමිණීමට තිබෙන අකමැත්ත.
4. කොමිස් වෙළඳපොළවල් තුළ පහසුකම් නැතිකම - වාහන නතරකිරීමේ ඉඩකඩ, වැසිකිළි හා ජල පහසුකම් ප්‍රමාණවත් නැත.

කොමිස් වෙළඳපොළේ වැදගත්කම ක්‍රමයෙන් අඩුවුවත් අදත් වටිනා කාර්ය භාරයක් එමඟින් සිදුවේ. එළවළු බහුල කාලයේ විකිණීමට නොහැකිවූ එළවළු ගොවීන් සහ පිටස්තර වෙළඳුන් විසින් කොමිස් වෙළඳපොළට එවනු ලැබේ. කීයට හරි විකිණීමට පුළුවන් වීම කොමිස් වෙළඳාමට පමණක් සීමාවූ සුවිශේෂ ලක්ෂණයකි.

කොමිස් වෙළඳපොළ හරහා සිදුවන බෙදාහැරීම හඳුන්වනු ලබන්නේ කේන්ද්‍රගත බෙදා හැරීමක් ලෙසිනි. එනම් දිවයිනේ විවිධ ප්‍රදේශවල නිෂ්පාදන, කොමිස් වෙළඳපොළට පැමිණ ඒ තුළින් පාරිභෝගික ප්‍රදේශවලට බෙදා හැරේ. මීට විකල්පව වර්ධනය වූ තොග වෙළඳාම විමධ්‍යගත බෙදාහැරීමේ රටාව ලෙස හඳුන්වයි. එහිදී වෙළඳාම විමධ්‍යගත වී ඇත.

බෙදාහැරීම විමධ්‍යගතවීම නිසා ඒ හා සම්බන්ධව කටයුතු කරන විශාල පිරිසක් දක්නට ඇත. නිෂ්පාදන ප්‍රදේශවල එළවළු එකතුකරන්නන් විශාල වශයෙන් බිහිවී ඇත. එමෙන්ම එළවළු

නිෂ්පාදන ප්‍රදේශවල වෙළඳපොළවල් බිහිවී ඇත. බණ්ඩාරවෙල, නුවරඑළිය සහ හපුතලේ උදාහරණ වශයෙන් පෙන්විය හැක. එමෙන්ම එලවළු බෙදාහැරීම සඳහා නව වෙළඳපොළවල් බිහිවී ඇත. දඹුල්ල, කැගල්ල, සහ අකුරැස්ස ඉන් සමහරකි. එළවළුවලට පමණක් නොව අනිකුත් ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේදී පාරිභෝගික ප්‍රදේශවලට (උදා:ගාල්ල,මාතර) වෙළඳුන් නිෂ්පාදන ප්‍රදේශවලට (උදා: නුවරඑළිය, වැලිමඩ) ගොස් තොග මිළදී ගෙන සිල්ලර වෙළඳුන්ට බෙදා හරී. නමුත් සහල් සහ අනිකුත් අතිරේක ආහාර බෝග බෙදා හැරීම එලවළුවලට ප්‍රතිවිරුද්ධ ආකාරයට සිදුවේ. එනම් නිෂ්පාදන ප්‍රදේශවල වෙළඳුන් පාරිභෝගික ප්‍රදේශවලට ගොස් එහි සිටින වෙළඳුනට ආහාර ද්‍රව්‍ය බෙදා හරී. ලෝකයේ බොහෝ රටවල සිදුවන්නේ මෙකී රටාවයි. එය අලෙවි වියදම් අඩුකරයි. එලවළු සඳහා මීට වඩා ප්‍රතිවිරුද්ධ බෙදාහැරීමේ රටාවක් වර්ධනය වී ඇත්තේ කොමිස් වෙළඳාමට පුරුදුවූ වෙළඳුන් පිරිසක් විමධ්‍යගත බෙදාහැරීමේ රටාව ආරම්භ කිරීම නිසයි.

විමධ්‍යගත බෙදාහැරීම වර්ධනය වීමත් සමඟ තරඟකාරිත්වය වැඩිදියුණුවී ඇත. ඒ තුළින් ගොවීන්ට විකල්ප අලෙවි මාර්ග වැඩිදියුණු වී ඇත. එළවළු නිෂ්පාදකයින්ට තමන්ගේ නිෂ්පාදන ප්‍රදේශයේ සිටින එකතු කරන්නන්ට පිටස්තර ප්‍රදේශවලින් පැමිණෙන වෙළඳුන්ට අලෙවි කිරීමට මෙමඟින් අවස්ථාව ලැබී ඇත. උදාහරණයක් ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ කඳපොල ගොවීන්ගෙන් 75%ක් පමණ සිය නිෂ්පාදන ප්‍රදේශයේදීම අලෙවි කරයි. 1970 ගණන්වල 90%ක් පමණ ගොවීන් සිය නිෂ්පාදන කොළඹට එවන ලදී.

එමෙන්ම විමධ්‍යගත බෙදාහැරීම තුළින් භාණ්ඩවල ගුණාත්මක භාවයද වර්ධනය වී ඇත. විමධ්‍යගත බෙදාහැරීම තුළ සිදුවන්නේ තොග වෙළඳාමකි. එනම් භාණ්ඩ මිළදී ගැනීමක් සිදුවේ. ඒ නිසා මිළදී ගත්තන් භාණ්ඩවල තත්ත්වය ආරක්ෂා කිරීමට උනන්දුවේ. කොමිස් වෙළඳාමේදී භාණ්ඩවල අයිතිය මාරුවීමක් සිදු නොවේ. ඒ නිසා තත්ත්වය ගැන සැලකිලිමත් නොවේ.

විමධ්‍යගත බෙදාහැරීම තුළින් බෙදාහැරීම කාර්යක්ෂම වී ඇත. පාරිභෝගික ප්‍රදේශ හා නිෂ්පාදන ප්‍රදේශ සෘජුව සම්බන්ධවීම නිසා බෙදාහැරීමේ කාලය කෙටිවී ඇත. එමෙන්ම භාණ්ඩ හිඟය මඟහැරී ඇත. විවිධ ප්‍රදේශ අතර පවතින මිළ පරතරය අඩුවී ඇත.

## නිගමනය

කාර්යක්ෂම බෙදාහැරීමේ රටාවක් තුළ අවශ්‍ය භාණ්ඩ, අවශ්‍ය පුද්ගලයාට අවශ්‍ය ආකාරයට, තරඟකාරී මිළකට ලබාගැනීමට හැකියාවක් තිබිය යුතුය. ඉහත සාකච්ඡා කළ ක්‍රම තුන සලකා බලන විට පෞද්ගලික අංශය ප්‍රමුඛකොට ගත් බෙදා හැරීමේ රටාව වඩා කාර්යක්ෂම බව ඉහත නිර්වචනය අනුව නිගමනය කළ හැක. වෙනත් වචනවලින් කියනවා නම් විවෘත ආර්ථිකය ක්‍රියාත්මක වීමත් සමඟ ආහාර බෙදාහැරීමේ රටාව පෙරට වඩා කාර්යක්ෂම වී ඇත. කාර්යක්ෂමතාව මණින එක් මිණුම් දණ්ඩක් වනුයේ මිළයි. පාරිභෝගිකයා ගෙවන මිළත් නිෂ්පාදකයා ලබන මිළත් අතර පරතරය බෙදා හැරීම සඳහා වැයවන වියදම් ලෙස සැලකේ. මෙම වියදම් අඩු කිරීම තුළින් බෙදාහැරීම වඩා කාර්යක්ෂම කළ හැකියි. ඒ සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කිහිපයකි.

1. තරඟකාරිත්වය වැඩි කිරීම - දැනට සිල්ලර වෙළඳාම තුළ තරඟකාරිත්වය වර්ධනය වී ඇත. නමුත් තොග වෙළඳාම තුළ එවැන්නක් තහවුරු වී නැත. ගොවිපළ මට්ටමේ බොහෝ අවස්ථාවලදී කිහිපදෙනෙකු අතට වෙළඳාම සීමාවී ඇත. ආහාර ආනයනයෙහිද ඒ තත්ත්වය පවතී.

2. අලෙවිකරණ යටිතල පහසුකම් වැඩිකිරීම, වෙළඳපොළවල් තුළ පහසුකම් වැඩිකිරීම, ප්‍රවාහන සේවා දියුණු කිරීම, විදුලිබලය සහ සංනිවේදන පහසුකම් ලබාදීම මේ අතර වැදගත්වේ. ඒ මඟින් අලෙවිකරණ වියදම් අඩුකළ හැකිය.

3. අලෙවිකරණ උපකාරක සේවා වැඩිදියුණු කිරීම, අලෙවි තොරතුරු සැපයීම, ප්‍රමිතිකරණය, අලෙවි ණය පහසුකම් සැපයීම මේ අතර වැදගත් වේ.

ඉහත සඳහන් කාර්යයන් සඳහා රාජ්‍ය අංශය මූලික වී කටයුතු කළ යුතුය. රාජ්‍ය අංශය සෘජුව බෙදාහැරීමේ කාර්යයට සම්බන්ධවීම හැකිතාක් දුරට අවම කළ යුතුය. පෞද්ගලික අංශයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන ආහාර බෙදා හැරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කර වැරදි තැන් නිවැරදි කිරීම රජයේ වගකීම වේ.